ලක්බිම

සීමාසහිත ලක්බිම නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම.
**කර්තෘ මණ්ඩලය**
445/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
දුරකථන : 011 2426000
ෆැක්ස් : 011 2441899, 011 2441897
ඊමේල් : daily@lakbima.lk

**බෙදාහැරීම් අංශය**
445/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
දුරකථන : 011 2426016, 0714 614003,
ෆැක්ස් : 011 2395484
ඊමේල් : circulation@lakbima.lk

**'ලක්බිම' දැන්වීම් අංශය**
සුමති කෝට් 491, ගාලුපාර, කොළඹ -03
දුරකථන : 2597315, 4-521955/521954/521912
ෆැක්ස් : 4518313

**කොටුව ශාඛාව - දැන්වීම්**
අංක 12, ශ්‍රීමත් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ-02 (රීගල් සිනමාහල අසල)
දුරකථන : 011 2439466 / ෆැක්ස් : 011 2439467
ඊමේල් : cityoffice@lakbim.lk

**මහනුවර ශාඛාව - දැන්වීම්**
35 18/2 , නම්මා වෙළෙඳ සංකීර්ණය
කොටුගොඩැල්ල වීදිය, මහනුවර
දුරකථන : 081 2215429
ෆැක්ස් : 081 2215429

# යාපනය සිසු ගැටුමේ නොදැකින යටි පෙළ

අරම්භයක් සඳහා මේ ඉතා කෙටි මතක් කිරීමක් පමණි. මීට වසර දෙකකට පමණ පෙර, 2014 අගෝස්තු 03 වන දින රාත්‍රියේ සබරගමුව විශ්වවිද්‍යාලයයේ දෙමළ සිසුවකු වූ සාන්තිකුමාර් සුදර්ශන්ට නාදුනනා පුද්ගලයින් කිහිප දෙනෙකු විශ්වවිද්‍යාල භූමියෙහිදී පහර දී සිහිසුන්ව සිටියදී බලංගොඩ රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළු කරනු ලැබිණ. ඉන් අනතුරුව දෙමළ හා මුස්ලිම් ළමුන් සබරගමුව විශ්වවිද්‍යාලයයට ඇතුලු නොකළ යුතු යැයි පෝස්ටර අලවා තිබිණ.

ඊළඟට, පසුගිය මාර්තු මස අවසානයේදී (31 වන දින) උඩව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයයෙහි දෙමළ නවක සිසුන්ට නවක වදය නොදීම සම්බන්ධයෙන් දෙවන වසර දෙමළ සිසුන් සමග සිංහල සිසුන් පටලවා ගත් ආරවුල සිව්වන වසරේ දෙමළ සිසුන්ට පවා පහර දීමට හේතු විණ. එදින දෙමළ සිසුන් සිව් දෙනෙකු බදුල්ල රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළු කළ බැව් සිංහල සමාජයට මතකදැයි නොදනිමි.

දකුණේ සිංහල ප්‍රදේශවල විශ්වවිද්‍යාලයයන්හි දෙමළ සිසුවන්ට එලෙසින් පහරදීම ගැන ප්‍රධාන මාධ්‍ය පවා අද මෙන් එදා උනන්දු නොවූණි. ඒවා සිංහල සමාජයට වැදගත් ප්‍රවෘත්ති නොවූණි. සිංහල ශිෂ්‍යයින්ගේ ඒ ප්‍රචණ්ඩත්වයට විරුද්ධ කිසිදු ඝෝෂාවක් සිංහල සමාජයෙන් මතු නොවූ බවද සහතිකව කිව හැක. එදා සිංහල ප්‍රචණ්ඩත්වයට විරුද්ධව හඬ නැගූ සිංහල සැදැහැවතුන් නොවූණි. නමුත්, පසුගිය 16 වන සෙනසුරාදා යාපනය විශ්වවිද්‍යාලයයෙහි දෙවන වසර විද්‍යා සිසුන් අතර ඇති වූ ගැටුම සම්බන්ධයෙන්, විශේෂයෙන් දෙමළ සිසු ප්‍රචණ්ඩත්වයට එරෙහිව ප්‍රධාන මාධ්‍යයන්හිත් සිංහල සමාජයේන් නැගෙන විරෝධයෙහි අඩුවක් නැත. මේ වෙනස කුමක්ද?

මේ ආණ්ඩුවේ කැබිනට් ඇමැතිවරයෙකු වන ඩී.එම් ස්වාමිනාදන් හා රාජ්‍ය ඇමැතිවරයෙකු වන යාපා අබේවර්ධන සමග මාධ්‍ය කටයුතු නියෝජ්‍ය ඇමැති පරණවිතාන එම ගැටුම සම්බන්ධව අදාළ පාර්ශ්ව සමග කතා කිරීමට යැයි යාපනයට පැමිණෙන විට මා සිටියේ යාපනයේය.

යාපනය විශ්වවිද්‍යාල බලධාරීන්ට වගකීම පවරා අවශ්‍ය පරිදි තීන්දු ගැනීමේ බලය ඔවුන්ට ලබාදී ඇතැයි මාධ්‍ය ඔස්සේ පසුදින දැන ගතිමි. ආණ්ඩුව එයට අත නොදම්ම හොඳ යැයි වහා සිතුණකි. එහෙත් ඒ දින කිහිපය ඇතුළත යාපනයේදී මට හමුවූ විවිධ තරාතිරමේ දෙමළ පුද්ගලයන් සතුව තිබූ නිහඬ කනස්සල්ලෙන් එයද ප්‍රශ්න කෙරුණි. කිසිදු දෙමළ පුරවැසියෙකු විශ්වවිද්‍යාල සිසු ගැටුම සාධාරණය කිරීමේ උත්සාහයක් නොගත්හ. තමන්ගේ දෙමළ දරුවන් යැයි දෙමළ සිසුනට වාසිවන අයුරු කතා ගෙතුවේද නැත. එහෙත් එම සිසු ගැටුම අනාගතය සම්බන්ධයෙන් ඔවුන් තුළ සැලකිය යුතු තිගැස්මක් කම්පනයක් ඇති කර තිබූ බැව් පැහැදිලි විය. පළමු වරට ඒකාබද්ධ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් යාපනය දෙමළ සමාජයේ වූ පොදු කම්පනය ප්‍රකාශයට පත්කර තිබුයේ උතුරු පළාත් සභා මහ ඇමැති සහ එහි විපක්ෂ නායක දෙපළය.

ඉතා ස්වාධීන පරීක්ෂණයක් ඔවුහු ආණ්ඩුවෙන් ඉල්ලති. ඒ පරීක්ෂණය හුදු නෛතික කාරණාවලට සීමා නොකර, මේ ගැටුමෙහි යටි පෙළ ඉන් සෙවිය යුතු යැයි ඔවුහු කියති. උතුරු පළාතේ ගැටලු නොවිසඳී තිබීම හේතුවෙන් සිසුන් හා සිසුන් නොවන සැවොම අතර අසහනයක් මෝරමින් ඇතැයි ඔවුහු කියති. යුද අපරාධ පිළිබඳ පරීක්ෂණ නොකඩවා ප්‍රමාද කිරීම, අනවශ්‍ය විශාල ආරක්ෂක බල ඇණි උතුරේ රඳවා තබා ගැනීම, වෙනත් පළාත්වලින් සැලකිය යුතු ශිෂ්‍ය ප්‍රතිශතයක් යාපනය විශ්වවිද්‍යාලයයට වාර්ෂිකව ඇතුළු කිරීම වැනි කාරණාද මේ ගැටුමෙහි යටි පෙළ වන බව මහ ඇමති හා විපක්ෂ නායක කියති. එනිසා නැවත මෙවැනි ගැටුමක් ඇති නොවන්නට ඒ අසහනකාරී ගැටලු සඳහා විසඳුම් ලබාදිය යුතු යැයි ඔවුන්ගේ අදහස වන්නේ ය.

මේ අතර, තම ආවේණික සිංහල ජාතිවාදය පිලි නොපැන ඉදිරිපත් කිරීමට ලිඛිත ප්‍රකාශයක් අතැතිව පසුගිය බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවට පැමිණි ජ.වි.පෙ නායක අනුර කුමාර කීවේ, ''.....මෙය සමාජයක් ලෙස හෙළා දැකිය යුතු හා පිටුදැකිය යුතු ජාතිවාදයේ විසකුරුභාවය... මෙම සිදුවීම තුළ දැකිය හැකියි. විශේෂයෙන්ම යාපනය විශ්වවිද්‍යාලයේ සිංහල සිසුන් පිරිසක් වෙත දෙමළ සිසුන් පිරිසක් විසින් කරන ලද පහරදීම, උතුරේ වර්ධනය වෙමින් ඇති ජාතිවාදී මනෝභාවයේ දිගුවක්. මෙය ඒ මොහොතේ පැන නැගුණු සිසුන්ගේ කෝපයක් හෝ ඒ මොහොතේ ඇතිවෙච්ච ආවේගයක් ලෙස අප සැලකිය යුතු නැහැ.....''

මෙය ඒ මොහොතේ ඇති වූ කෝපයක් හෝ ආවේගයක් නොවේ යැයිද මෙය ''උතුරේ වර්ධනය වෙමින් ඇති ජාතිවාදී මනෝභාවයේ දිගුවක්'' යැයිද ජ.වි.පෙ. නායකයා කියන විට එහි එකම තේරුම විශ්වවිද්‍යාලයේ පමණක් නොව උතුරේ දෙමළ සමාජය සමස්තයක් ලෙස දන් ජාතිවාදයට ගමන් කරන බවය. හැම ආකාරයේම ජාතිවාදීන් මෙය තමන්ගේ වාසියට යොදා ගැනීමට ඉඩ ඇති හෙයින් ආණ්ඩුව වහා මෙය පාලනය කිරීමට පියවර ගත යුතුයැයි අනුර කුමාර ආණ්ඩුවෙන් ඉල්ලා සිටින විට, ඔහු ඉල්ලන්නේ ඔහුගේ සිංහලවාදී අර්ථකථනයට අනුව ''උතුරේ වර්ධනය වෙමින් ඇති'' දෙමළ ජාතිවාදය පාලනය කිරීමට ආණ්ඩුව වහා පියවර ගත යුතු බව මිස විශ්වවිද්‍යාලයේ ගැටුමට ස්ථාවර විසඳුමක් නොවන බව පැහැදිලිය.

යාපනයේ විශ්වවිද්‍යාල සිසු ගැටුම හුදෙක් සිසු ගැටුමකට සීමා කර ගණන් බැලිය නොහැකිය. එවගේම එය අනුර කුමාර වැනි සටකපට සිංහල ජාතිවාදීන්ගේ කෝදුවෙන් මනින්නටද නොහැකිය. එය මැනිය යුත්තේ ''අනෙකාගේ ප්‍රශ්න'' පූර්ව තීන්දුවලින් තොරවතේරුම් ගැනීමට සූදානම් උපේක්ෂා සහගත නිදහස් මානසිකත්වයකින් පමණි. ඇමෙරිකානු මාධ්‍යවේදිනියක් රිපබ්ලිකන් ජනාධිපති අපේක්ෂක තේරීමේ පූර්ව තරග වටයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් ගැන කියූ අයුරු, ''ඉස්සෙල්ලම ඇසිය යුතු ප්‍රශ්නය තමයි, අනෙකාගෙන් ඔබ බලාපොරොත්තුවන්නේ කවර ආකාරයේ පිළිගැනීමක්ද? සැලකීමක්ද? කියලා. ඔබ ඔබට අවශ්‍යයැයි කියන ඒ සැලකීම, ඒ පිළිගැනීම අනෙකාට ලබා දෙන්නට සූදානම් නැති නම්, ඔබ ජාතිවාදයෙන් විකෘතිවූ මනසක් සහිත සතෙක්''.

අප කොටුව ඉන්නේ ''අනෙකා'' හඳුනාගැනීමට වුවමනාවක් නැති එවැනි ජාතිවාදී මතවාද සමගය. ඉන් නිදහස්ව හිතන්නට සහ ප්‍රශ්න තේරුම් ගැනීමට අවංකව උත්සාහ කරනවුන්ද නැතුවා නොවේ. යාපනය විශ්වවිද්‍යාලයයේ ගැටුමද වඩා නිදහස් මනසකින් බලන්නට ආරාධනා කරන කැලණිය විශ්වවිද්‍යාලයයෙහි ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගල්කන්දේ ධම්මානන්ද හිමි

> **"පරීක්ෂණ පැවැත්විය යුත්තේ පළමුව පහර දුන්නේ කවුරුන්දැයි සෙවීමට වඩා දෙමළ සිසුන්ට වෙනත් ඕනෑම විශ්වවිද්‍යාලයකට ගොසින් තර්ජන හා අනතුරු නොමැතිව නිදහසේ ඉගෙන ගැනීමටත් සිංහල සිසුන්ට යාපනය විශ්ව විද්‍යාලයට ගොසින් එලෙසින්ම නිදහසේ ඉගෙන ගැනීමටත් හැකි ස්ථාවර පරිසරයක් හදා ගන්නේ කෙසේදැයි විසඳුම් සෙවීමටය"**

උපුටා දක්වන්නට එබැවින් මම කැමැත්තෙමි.

''සාමාන්‍ය තත්ත්වය තමයි, විශ්වවිද්‍යාල පිහිටලා තියෙන ප්‍රදේශයේ සංස්කෘතිය ප්‍රධාන භූමිකාවක් හොබවනවා. කැලණිය, පේරාදෙණිය වගේ විශ්වවිද්‍යාල ගත්තහම, එහි ප්‍රධාන උත්සවවලදී ප්‍රමුඛවෙන්නේ ඒ ප්‍රදේශයේ සංස්කෘතිය. යාපනයේ විශ්ව විද්‍යාලය ගත්තම ඒ ප්‍රදේශයේ සංස්කෘතිය ප්‍රධානවීම වළක්වන්න බැහැ.''

එම හේතු දක්වීමට විරුද්ධ විය හැක්කේ ''සිංහලයා'' මේ රටේ ''අධිපති ජාතිය'' යැයි විශ්වාස කරන හා ඒ ''විශ්වාසය'' ප්‍රශ්න කිරීමට ඉඩ නොදෙන මානසික විකෘතීන්ට පමණි. සෙස්සනට මේ හේතු දක්වීම යථාවාදී හේතු දක්වීමකි. උන්වහන්සේ තේරුම් කරන අයුරු, විශ්වවිද්‍යාල සතු පොදු සම්මත වාගෙ'ම, ''උප සංස්කෘතීන්ද'' ඇත. ඒවා සතු සම්මතයන්ට පටහැනි ''නවාංග'' ඇතුළු කිරීමට යෑම යාපනයේ පමණක් නොව හැම විශ්ව විද්‍යාලයයකම හැමවිටම ප්‍රතිරෝධයන්ට හා විරෝධයන්ට හසුවන්නේය. එම හේතු දක්වීම තුළ සම්මත සිංහල නැටුමක් ලෙස සාඩම්බරයෙන් කතා කරන ''උඩරට නැටුම'' යාපනය විශ්වවිද්‍යාලයයෙහි උත්සවයකදී ප්‍රමුඛ සංස්කෘතික අංගයක් ලෙස ඉදිරිපත් කිරීමට යෑමම, ප්‍රශ්නකාරී වන්නකි. ඒ පසුබිමෙහි ධම්මානන්ද හිමිගේ මේ හේතු දක්වීම බෙහෙවින් වටනේ ය.

''.....මේ දෙමළ ශිෂ්‍ය පිරිස පසුගිය අවුරුදු 30 ක යුද්ධයේ, ඒ ගැටුමට සම්බන්ධ වෙච්ච එක පාර්ශ්වයක, ජන කොටසක ළමයි. මේ ළමයින්ගේ සමහරවිට ඥාතීන් මිය ගිහිල්ල ඉන්න පුළුවන්. පවුලෙ අය විනාශ වෙලා තියෙන්න පුළුවන්. එක්තරා විදියක යුද්ධයන් පරාජය වුණ කණ්ඩායම නියෝජනය කරන, එහෙම අය ඥාතීන් අහිමි වෙච්ච ළමයි පිරිසක්. ඒක සුවිශේෂී තත්ත්වයක්.....අපි දන්නවා, සමහර දෙමළ වැසියන්ගෙ මුල් ගම්වලට, ගෙවල්වලට තාමත් යන්න බැහැ. යුද්ධය අවසන්වෙලා වසර ගණනක් ගියාට පස්සෙත් තමන්ගෙ මුල් ගමට, ගෙදරට යන්න බැරුව ඉන්න ළමයි කියන්නේ කිසියම් ආවේගශීලී අමනාප හැඟීමක් තියෙන ළමයි. පරාජිත පිලට අයත්යැයි හිතන පිරිසක් නිතර හමුදාව නැවත නැවත දකිනකොට, ඒක හඳුන ගන්නවා ඇත්තේ තමන්ගේ නිදහසට එරෙහිව ආධිපත්‍යයක් ක්‍රියාත්මක වෙනවාය කියන තත්ත්වය. මෙකත් මම හිතනවා, ලංකාවේ අනෙක් විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයින්ට හෝ යාපනය විශ්වවිද්‍යාලයට යන සිංහල ශිෂ්‍යයාට පොදු නොවන, යාපනය විශ්වවිද්‍යාලයේ ඉන්න දෙමළ ශිෂ්‍යයාට පමණක් සුවිශේෂීවන තත්ත්වයක්....''

මේ දෛනික වටපිටාවෙන් තොර යාපනයේ විශ්වවිද්‍යාලයක් ඇත්තේ නැත. යාපනය විශ්ව විද්‍යාලයයේ දෙමළ සිසුන් යැයි අප හඳුනාගත යුත්තේ එවැනි සමාජ පරිසරයක, සමනය නොවන ආතතියක් සහිතව ජීවත්වන සිසුන් පිරිසකි. ඉන් ගැලවෙන්නට උසස් අධ්‍යාපනය පිටිවහලක් වේයැයි සිතන දෙමාපියන්ගේ දරුවන්ය. මෙතෙක් කිසිදු ආණ්ඩුවක් ඒ පරිසරය වඩා යහපත් කිරීමට පියවර නොගන්නා හෙයින්ම නිරන්තර පීඩනයකට හසුව ඉන්නා සිසුන් පිරිසක් ලෙසය. අදාළ බලධාරියා කවුරුන් හෝ යාපනය විශ්වවිද්‍යාලයට සිංහල සිසුන් ඇතුළු කරන්නට තීන්දු ගන්නේ ඒ කිසිවක් ගැන කිසිදු තැකීමක් ඇතිව නොවේ. යුද්ධයෙන් පසු අවශ්‍යවන සංහිඳියාව සඳහා කිසිදු වැදගත් වැඩපිළිවෙළක් උතුරේ ක්‍රියාත්මක නොවූණු වටපිටාවක සිංහල ශිෂ්‍යයින් හා සිංහල සංස්කෘතිකාංග යාපනය විශ්වවිද්‍යාලයයට හඳුන්වා දීමට යාමේ බරපතළ වරද,ධම්මානන්ද හාමුදුරුවො මතු කරන අනෙක් ඉතා වැදගත් කාරණාවය. (සමස්ත කතාව: https://youtu.be/OMCg-cL16sY0&

මේ දෙමළ ශිෂ්‍යයින් සියලු දෙන ඉපිද ඇත්තේ අවුරුදු 30 ක යුද්ධය අතරතුරය. මේ කාලයේ දකුණේ සිංහල සමාජය සමග ඔවුන්ට කිසිදු ගනුදෙනුවක් නොතිබිණ. ඔවුන් සිංහල යැයි හඳුනා ගෙන ඇත්තේ සිංහල හමුදාව සහ පොලීසියය.

එනිසා ඔවුන්ගේ නොවිසඳුණු සියලු ප්‍රශ්න වෙනුවෙන් වගකිව යුත්තේ සිංහල සමාජය හා ඔවුන් මධ්‍යයයේ රඳවා ඇති සිංහල හමුදාව යැයි මේ දෙමළ සිසුන් තේරුම් ගැනීම වැළකිය නොහැක්කකි. එම පසුබිම ගැන කිසිදු අවබෝධයක් නැති, සිංහල සමාජආධිපත්‍ය තමන්ට ඓතිහාසිකව හිමිවන්නක් ලෙස පදම්වූ මානසිකත්වයක් ඇති බහුතර සිංහල ශිෂ්‍ය පරම්පරාවේ පිරිස් සැලකිය යුතු සංඛ්‍යාවක් යාපනය විශ්වවිද්‍යාලයට යැවීමේ වරද එබැවින් බාරගත යුත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ පැවති හා පවතින ආණ්ඩුය. මේ වන විට යාපනය විශ්ව විද්‍යාලයයේ සිසුගහනය දළ වශයෙන් 4,000 ක් පමණය. ඉන් දෙකෙන් පංගුවකට ආසන්න සංඛ්‍යාවක් දෙමළ මාධ්‍යයෙන් පමණක් ඉගෙන ගන්නා කලා උපාධි අපේක්ෂක සිසු සිසුවියන්ය. එනමුත් කලා පීඨයේම නීති උපාධිය සඳහා සාමාන්‍යයෙන් ඇතුළුකර ගන්නා සිසු සංඛ්‍යාවෙන්ඇතැම් විට සියයට 70 ක් පමණ සිංහල සිසුන්ය. අනෙක් පීඨ හා උපාධි පාඨමාලා ගත්විට සාමාන්‍යයෙන් යාපනය විශ්වවිද්‍යාලයෙහි සිසුගහනයෙන් සියයට 35 - 40 ත් අතර ප්‍රමාණයක් සිංහල සිසු සිසුවියන් ය.

උතුරේ වැනි දීර්ඝ කාලීන ගැටුම් සමග නොවිසඳුණු සමාජ දේශපාලනික ගැටලු ඇති වාර්ගික වශයෙන් සුවිශේෂී සමාජයක විශ්වවිද්‍යාලයක පැවැතිය හැකි සාමාන්‍ය අධ්‍යයන වටපිටාවක් තහවුරු නොවිය හැකි බව ආණ්ඩුව සහ විශ්වවිද්‍යාල බලාධිකාරය තේරුම්ගත යුතුව තිබිණ. එවැනි විශ්වවිද්‍යාලයයකට සිංහල සිසුන් ඇතුළු කිරීමෙන් සංහිඳියාවක් ඇති වන්නේ යැයි සිතීමත් අනුවණ කමෙකි. සිංහල සමාජයේ පිරිස් උතුරට සංචාරකයින් ලෙස යෑමෙන් ඇති කළ හැකි සංහිඳියාවක්ද නැත. එබැවින් මේ අවාසනාවන්ත ගැටුමෙහි වගකීම මූලික වශයෙන් බාරගත යුත්තේ එදින පහරදුන් හා පහර කෑ සිංහල සහ දෙමළ ශිෂ්‍යයින් නොව, ආණ්ඩුව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමය.

සිංහල සිසුන්ගේ දෙමාපියන් තම දරුවන් නැවත යාපනය විශ්වවිද්‍යාලයෙහි ඉගෙනීමට යැවීම ගැන දක්වන තර්ක විතර්ක කවරක් වූවත් ඔවුන්ගේ අකමැත්ත මේ අවිනිශ්චිත පසුබිමෙහි සාධාරණ බව පිළිගත යුතුය. දෙමළ ජනතාවගේ දීර්ඝ කාලීන ප්‍රශ්න වෙනුවෙන් විසඳුම් ලබා නොදෙන පරිසරයක දෙමළ සමාජයෙහි කැකෑරෙන අසහනය හා ආතතිය හමුවේ නැවත එවැනි ගැටුම් ඇති නොවේ යැයි සිංහල දෙමාපියන්ට සහතික දිය හැකි කිසිවකු නොමැති හෙයිනි. එබැවින් පරීක්ෂණ පැවැත්විය යුත්තේ පළමුව පහර දුන්නේ කවුරුන්දැයි සෙවීමට වඩා දෙමළ සිසුන්ට වෙනත් ඕනෑම විශ්වවිද්‍යාලයකට ගොසින් තර්ජන හා අනතුරු නොමැතිව නිදහසේ ඉගෙන ගැනීමටත් සිංහල සිසුන්ට යාපනය විශ්ව විද්‍යාලයට ගොසින් එලෙසින්ම නිදහසේ ඉගෙන ගැනීමටත් හැකි ස්ථාවර පරිසරයක් හදා ගන්නේ කෙසේදැයි විසඳුම් සෙවීමටය. දැනට කෙරෙන පරීක්ෂණ හැමදාම ගැටුමකට පසු කෙරෙන සරල පරීක්ෂණ පමණි. එමගින් ඇත්ත ප්‍රශ්නයට උත්තර සෙවිල්ලක් නැත. ඒ සමග කෙරෙන්නේ මූලික වගකීමෙන් පාලකයින් අත සෝදා ගැනීමක් බව මෙහිදී අවධාරණය කළ යුත්තකි.

ඡායාරූප - සනත් ප්‍රියන්ත වවුනියාව




**කුසල් පෙරේරා**

## මොරගහකන්ද වාරි වික්‍රමය

එදා හෙළ රජ දවස මේ රටේ ඉතිහාසයේ රන් අකුරින් නම් කෙටූ රජවරුන් අතර මහ පරාක්‍රම්බා, මහසෙන් වැන්නවුන් ගොවියන් සනහාලන්නට වැර වෑයම් කළේ මෙයින් වසර දහස් ගණනකට පෙරය. රට සරු කළ වැසිදිය ගංදිය වෙනුවට අප හීතියට ත්‍රාසයට පත්කළ රුහිරු දහරාවලින් මේ බිම තෙත් වූ අවස්ථාද ඉතිහාසයේ සටහන් වී ඇත්තේය.

දැන් එළැඹී ඇත්තේ වරෙක සොඳුරු වූද වරෙක රුදුරු වූද මියගිය අතීතය ගැන හඬා දොඩා වැළපිය යුතු කාලයක් නම් නොවේ. උදම් ඇතිය යුතු අවස්ථාවක්ද නොවේ. කළ යුත්තේ පෙර වූ වැරදි හඳාගෙන සිනහමුසු මුහුණින් හෙට දවස ගැන කතාබහ කළ හැකි යුගයක් ආරම්භ කිරීමය.

රියේ මොරගහකන්ද ව්‍යාපෘතියට අදාළව නිදන් තැන්පත් කිරීමේ උළෙල පැවැත්විණි. කවුරු ආණ්ඩු කළත් මොන පාලකයා සිටියත් ගොවියාට වතුර ටික, පොහොර ටික, භූමිය ලැබිය යුතු බව එහිදී ජනාධිපතිතුමා ප්‍රකාශ කළේය. රට හැදෙනවා නම් ජනතාවට සහනයක් සැලසෙනවා නම් පාලකයා හෝ පක්ෂය අපට වැදගත් නොවේ. වැදගත් වන්නේ හරියට වැඩ කිරීමය. ජනතාවගේ අපේක්ෂා මුදුන්පත්වන ලෙස වැඩ කිරීමය.

රටේ සංවර්ධනයට මහවැලියේ ඇති වැදගත්කම මුලින්ම අවධානයට ලක් වන්නේ මෙයින් වසර ගණනාවකට පෙර පටන්ය. අවස්ථා දෙකකදීම විදේශ වාර්තා මහින් මෙබඳු ව්‍යාපෘතියක වටිනාකම මෙරට පාලකයන්ට ඒත්තු ගන්වා තිබේ. සී.පී. ද සිල්වලා, මෛත්‍රීපාල සේනානායකලා, ගාමිණී දිසානායකලා මහවැලි වතුරෙන් රට හදන්නට හැකිබව ඔප්පු කොට පෙන්වා ඇත. රටට විදුලිබලය ලබාදිය හැකි බව තහවුරු කොට ඇත.

මොරගහකන්ද ජල ව්‍යාපෘතිය ගැන කතාබහ පටන් ගන්නේ වර්තමාන ජනාධිපතිවරයා කෘෂිකර්ම හා මහවැලි අමාත්‍යවරයාව සිටියදීය. මෙයින් වසර නවයකුත් මාස පහකට පෙර දිනයක මේ සම්බන්ධව මහා උත්සවයක් පැවැත්වෙයි. එදා උළෙලෙහිදීද ජනතාව අමතමින් මේ "ගොවියා පුතු" ප්‍රකාශ කොට ඇත්තේ වතුරට රණ්ඩු දබර කරන අපේ රටේ ජනතාවට වතුර ටික ලබාදීම මහා පින්කමක් බවය. එදා මෙරට ජනතාව ඒ පින්කමෙහි ආනිශංස භුක්ති විඳින්නට බලා හිටියත් එය එසේ සිදුවූයේ නැත.

දියට හඬා වැළපුණු කඳුරත්තන්ට හිස් අහස දෙස බලා වැළපෙන්නට සිදුවිය. බැසිල් මල්ලි චමල් අයියාට ඇමැතිකම දෙන්නට හැදුවේය. අන්තිමට මෛත්‍රීට ඇමැතිකම ලැබුණත් සල්ලි ලැබුණේ නැත. පසුගිය ආණ්ඩු කාලය තුළ අධිවේගී මාර්ග හැදුවේය. මත්තල ගුවන්තොටුපළක් ඉදිවුණේය. මාගම්පුර වරායක් හැදුණේය. ඒවාට වීන ආධාර ලැබුණි. එහෙත් මොරගහකන්ද ගැන බලන්නට හොයන්නට කෙනෙක් හිටියේ නැත.

රටේ ප්‍රධාන පුරවැසියා වන වර්තමාන ජනාධිපතිවරයා දැන් මහවැලි ඇමැතිකමද උසුලයි. දැන්නම් ඔහුගෙන් ඇමැතිකම් ඉල්ලන්නට හෝ පැහැර ගන්නට කෙනෙක් නැත. වීන ආණ්ඩුවෙන් ඇති තරමට ආධාරද ලැබෙන බව සිතිය හැකිය. 2007 වර්ෂයේදී ගණන් බලා තිබූ ආකාරයට මෙම ව්‍යාපෘතියට වියදම කොටි පන්දාහකි. දැන්නම් ඒ ගණන කෝටි දාහත්දාහද ඉක්මවයි. යම් ව්‍යාපෘතියක් ප්‍රමාද වීමේ ඛේදවාචකය කොතරම් බිහිසුණුද? මහා වියදමක් කියාට මහා ව්‍යාපෘති නැතිව රට හදන්නට නොහැකිය. වරද ඇත්තේ වියදමෙහි නොවේ. වංචාවෙහි හා දූෂණයෙහිය. මෙබඳු බහුකාර්ය ව්‍යාපෘතිවලින් යටිමඩි ගසා ගන්නට ගියොත් නම් ඉදිරි ආණ්ඩුවකට අගුත් විදියේ කොමිෂන් පත් කරන්නට සිදුවෙයි.

යහපාලන ආණ්ඩුව යටතේ එවැනි දේ සිදුවෙතැයි මේ රටේ මහජනයා සිතන්නේ නැත. එය එසේම විය යුතුය.

යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී අප වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ එයින් රටට සිදුවන යහපත ගැනය. මේ මහා ජලකඳින් මේ රටේ භූමියෙන් හෙක්ටයාර් අසූහත්දාහක භූමියක් අස්වද්දන්ට හැකි බවට ගණන් බලා ඇත. පවුල් 3,500ක් අදාළ භූමි ප්‍රදේශයන් හි පදිංචි කළ හැකි වෙතැයි අපේක්ෂිතය. මෙට්‍රික් ටොන් තුන්දහසක මත්ස්‍ය සම්පතක් ලබාගැනීමටද හැකි බව ප්‍රකාශ වෙයි. මෙගාවොට් 25ක විදුලි බල උත්පාදනයක් ගැනද අවධානය යොමු වී තිබේ.

දැන් ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රබල පාගමන් ක්‍රියාකාරුවකුව සිටින ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීවරයා ඒ කාලයේ ඇමැති කෙනෙකි. මෙයින් වසර නවයකට පෙර මොරගහකන්ද ව්‍යාපෘතියට මුල්ගල් තබන උළෙලට සැකසූ පෝස්ටර්යේ ඔහු යෙදූ සිරස්තලය වූයේ මොරගහකන්ද වාරි වික්‍රමයයි. ඩලස්ගේ යෙදුම් අදටත් උචිතය.